*සැ. යු.*– 2006.09.22 දින පළ කරන ලද අංක 1,464 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,465- 2006 සැප්තැම්බර් 29 වැනි සිකුරාදා - 2006.09.29**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 826 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 827 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*– (i) ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මාළිගාවත්ත ජනාසා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන භාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ඔක්තෝම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නිවේදන

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ, 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/ර/38.

රත්නපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී අභිනවාරාමයේ පිහිටි ර/සිරි ශාන්තිදේව විද්‍යානිකේතන පිරිවෙන 2005.06.09 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන ගරු වැලිපත චන්ද්‍රවිමල ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6), (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේනොත් මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2006 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල,
"ඉසුරුපායේ", අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

09- 831/2

---

**තොග ගණන් ගැනීම හා වාර්ෂික හරි වැරදි බැලීම සඳහා රාජ්‍ය වෛද්‍ය සැපයීම් අංශයේ මධ්‍යම ගබඩාව වසා තැබීම**

වර්ෂ 2006 දෙසැම්බර් මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වන දින දක්වා (දෙදිනම ඇතුළුව) තොග ගණන් ගැනීම හා වාර්ෂික හරි වැරදි ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා වසා තබනු ඇත.

අත්‍යාවශ්‍ය හදිසි ඖෂධ හා අබිං මිශ්‍රණ හැර වෙනත් කිසිම ඖෂධයක් සඳහා එම කාල පරිච්ඡේදය තුළදී අයදුම්පත් භාර නොගන්නා බව පළාත් සහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය පළාත් සහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය බී. වී. එස්. එච්. බෙනරගම,
වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ.

අංක 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10, වෛද්‍ය සැපයීම් අංශයේ දී ය.

09-775

---

**අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුන දෙමළ කොට්ඨාශයෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසම**

2006 වර්ෂයේ පාන්ඩිරුප්පු ශ්‍රී තුරෝපදයි අම්මාන් කෝවිලේ වාර්ෂික උත්සවය

මෙම දේවාලයේ 2006 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2006 සැප්තැම්බර් මස 19 වැනි දින ආරම්භ වී 2006 ඔක්තෝබර් මස 07 වැනි දින නිමාව දැක්වෙන බව සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් අයට මෙයින් දන්වනු ලැබේ.

02. 1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් අයට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම උත්සව භූමියේ මායිම් පහත සඳහන් පරිදි බව කරුණාවෙන් සලකන්න.

උතුරට : පාන්ඩිරුප්පු පුල්ලෙයාර් කෝවිල පාර,
නැගෙනහිරට : පාන්ඩිරුප්පු වෙරළ පාර,
දකුණට : කල්මුණ පාන්ඩිරුප්පු මායිම් පාර,
බස්නාහිරට : පෙරියකුලම් බැම්ම පාන්ඩිරුප්පු

ව. වාසුදේවන්,
ප්‍රාදේශීය ලේකම්.

09-800

---

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ, 26 වන 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3 (6) (අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/අනු/42.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි අනු/ශ්‍රී ඥාණිස්සර මූලික පිරිවෙන 2005.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය උඩදෙණියේ විමලඥාණ ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3 (6), (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේනොත් මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2006 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල,
"ඉසුරුපායේ", අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

09-831/1

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0303300225.

ණයකරුගේ සම්පූර්ණ නම : දූවලගේ අයිඩින්

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එෆ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 720 හා 1995.08.02 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටහතරදහස් හැත්තෑඑකයි ශත පනස්හතක (රු. 1,64,071.57) මුදලක් වර්ෂ 2006.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතලිස් හතර දහස් අනූහතයි ශත හතලිස් දෙකක (රු. 44,097.42) මුදල ද, වර්ෂ 2006.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ දහනමදහස් නමසිය හැත්තෑ හතරයි ශත පහලොවක් (රු. 1,19,974.15) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටහතරදහස් හැත්තෑඑකයි ශත පනස්හතක (රු. 1,64,071.57) ද,

(2) එකී රුපියල් හතලිස් හතර දහස් අනූහතයි ශත හතලිස් දෙකක (රු. 44,097.42) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2006.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ ජූනි මස 12 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ, දකුණු මග්ගොන බද්දහි හෙලකඳවිල ග්‍රාමයෙහි දෙල්ගහලන්ද හි ලොට් 'සී' නමැති ඉඩමට 1969.04.01 දින ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 2033 පිඹුර ප්‍රකාර ලොට් සී4 ට මායිම් (නමුත් ඔප්පු අංක 628) හි දැක්වෙනුයේ 1969.03.30 දින ලෙසය) උතුරට: කළුතර දිස්ත්‍රික් උසාවි යේ නඩු අංක 555/පී යටතේ බෙදන ලද එකී ඉඩමේම දැක්වෙන ලොට් බී ද ; නැගෙනහිරට : ලොට් 5 (පාරට වෙන් කරන ලද) සහ ලොට් සී3 ද ; දකුණට : ලොට් සී 2 ද ; බටහිරට : නුගේ උඩුමුල්ල කුඹුර (ටී. පී. 74689 හි දැක්වෙන ඉඩම) ද යන මායිම්තුළ පිහිටි පර්චස් නමයයි දශම එකයි බින්දුවක (අක්. 0, රූ. 0, පර්. 9.10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමඟ කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 168/173 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සාමාන්‍යාධිකාරි,

09-910

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500000596.

ණයකරුගේ සම්පූර්ණ නම : නොරොන්හු හලු සුමේධ සංජීව

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 1223 හා 1997.12.26 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අසූදහස් හාරසිය තිස්නමයයි ශතඅනූඅටක (රු. 80,439.98) මුදලක් වර්ෂ 2004.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටහයදහස් හයසිය තිස්අටයි ශත හැටඅටක (රු. 66,638.68) මුදල ද, වර්ෂ 2004.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහතුන් දහස් අටසිය එකයි ශත තිහක් (රු. 13,801.30) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූදහස් හාරසිය තිස්නමයයි ශත අනූඅටක් (රු. 80,439.98) ද,

(2) එකී රුපියල් හැටහයදහස් හයසිය තිස්අටයි ශත හැටඅටක (රු. 66,638.68) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2005.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ජී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ පෙබරවාරි මස 21 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මැද්දකැටිය කෝරළේ, කන්දෙගෙදර සහ මෙතන්ගරේ ග්‍රාමයන්හි පිහිටි කන්දෙගෙදර නැමැති ඉඩමට 1996.10.15 දින බී. එච්. ඒ. ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651ඒ පිඹුර ප්‍රකාර ලොට් 64 ට මායිම්, උතුරට : පාරට වෙන්කරන ලද ලොට් ආර් 10ක් ද ;, නැගෙනහිරට : ලොට් 61 ද ; දකුණට : ලොට් 63 ද ; බටහිරට : ලොට් 65 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අ. 00, රූ. 00. පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N85/101 හි ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී කන්දෙගෙදර නමැති ඉඩමට 1996.10.15 දින බී. එච්. ඒ. ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651ඒ පිඹුර ප්‍රකාර ලොට් 65 ට මායිම්, උතුරට : පාරට වෙන් කරන ලද ලොට් ආර් 10 ද ; නැගෙනහිරට : ලොට් 64 ද ; දකුණට : ලොට් 66 ද, බටහිරට : ලොට් 68 සහ 69 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි (අ. 00, රූඩ් 00, පර්. 15)ක් වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සාමාන්‍යාධිකාරී,

09-913

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100005761.

ණයකරුගේ සම්පූර්ණ නම : ඇහැලපිටිය හේවගේ ජෝතිපාල ගුරුසිංහ සහ තන්ත්‍රිගේ මාලනී රුබේරු

පිළියන්දල ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. විමලසිරි විසින් ලියා සහතික කරන ලද අංක 1234 හා 2002.04.06 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටනමදහස් දෙසියහැටහයයි ශත එකක (රු. 1,69,266.01) මුදලක් වර්ෂ 2004.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හතලිස්අටදහස් අටසියපනස්එකයි ශත හැටක (රු. 1,48,851.60) මුදල ද, වර්ෂ 2004.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිදහස් හාරසියදාහතරයි ශත හතලිස් එකක් (රු. 20,414.41)ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටනමදහස් දෙසියහැටයයි ශත එකක (රු. 1,69,266.01) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හතලිස්අටදහස් අටසියපනස් එකයි ශත හැටක (රු. 1,48,851.60) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2004.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ජී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ මාර්තු මස 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ තුම්බෝවිල ග්‍රාමයෙහි පිහිටි තල්අරඹේ වත්ත නැමැති ඉඩමට 1990.05.20 දින පී. ඩී. පී. වීරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1174 පිඹුර ප්‍රකාර ලොට් 03 ට මායිම්, උතුරට : ලොට් 02 ද ; නැගෙනහිරට : බෝකුන්දර සිට ගංගාරාම දක්වා වූ පාර ද ; දකුණට : ලොට් 04 ද ; බටහිරට : ලොට් 07 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම එකක (අ. 00, රූ. 00, පර්. 13.1) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 200/167 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සාමාන්‍යාධිකාරී.

09-911

මගේ අංකය : එන් (පීවීඑස්) 30105.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ස්මාර්ට් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.09.24 දින සංස්ථාපිත සමාගමක් වන ස්මාර්ට් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ස්මාර්ට් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 අගෝස්තු මස 29 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

09-755

---

මගේ අංකය : එන් (පීවීඑස්) 14854.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ග්ලේන්පෝල් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1995.04.26 දින සංස්ථාපිත සමාගමක් වන ග්ලේන්පෝල් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ග්ලේන්පෝල් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 අගෝස්තු මස 25 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

09-754

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2503300161 සහ 2500000789.

ණයකරුගේ සම්පූර්ණ නම : කුලසිංහ ආරච්චිගේ කරුණාසේන

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. එම්. පියවර්ධන සහ කේ. ඒ. ධර්මසේන විසින් ලියා සහතික කරන ලද අංක 8048 සහ 537 හා 1996.07.10 සහ 1998.08.28 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිහත්දහස් අටසිය පනස්නමයයි ශත දහනමයක (රු. 2,27,859.19) මුදලක් වර්ෂ 2004.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් හතලිහයි ශත විසිහතරක (රු. 1,81,040.24) මුදලද, වර්ෂ 2004.08.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස්හයදහස් අටසිය දහඅටයි ශත අනූපහක් (රු. 46,818.95) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිහත්දහස් අටසිය පනස්නමයයි ශත දහනමයක (රු. 2,27,859.19) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් හතලිහයි ශත විසිහතරක (රු. 1,81,040.24) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2004.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004 ක් වූ නොවැම්බර් මස 04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මොගොඩපොත පත්තුවේ, දෙහිගම්පල් කෝරළේ, යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, හතගොඩ

ග්‍රාමයෙහි පිහිටි හිටිනාවත්තහි කොටසක් නැමැති ඉඩමට 1995.11.27 දින එස්. අබේසිරිවර්ධන මානක තැන විසින් මැන සම්පාදිත අංක 2250 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : පහළ කොටුව ද, නැගෙනහිරට : හිටිනාවත්තහි කොටසක් ද, දකුණට : තෙල්හිටියාව ග්‍රාමය ද, බටහිරට : රිටිගහවත්ත ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතරක (අ. 0, රූඩ් 0, පර්. 14) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් 570/264 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-904

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 25/0/00/00606.

ණයකරුගේ සම්පූර්ණ නම : වීරසිංහගේ සෙනරත්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 1233 හා 1998.01.17 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැට තුන්දහස් හයසිය අනූතුනයි ශත අනූහතරක (රු. 63,693.94) මුදලක් වර්ෂ 2004.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී මූලික ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස් දෙදහස් අටසිය පනස් අටයි ශත පනහක් (රු. 52,858.50) මුදලද, වර්ෂ 2004.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහදහස් අටසිය තිස්පහයි ශත හතලිස් හතරක් (රු. 10,835.44) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැට තුන්දහස් හයසිය අනූතුනයි ශත අනූහතරක (රු. 63,693.94) ද,

(2) එකී රුපියල් පනස් දෙදහස් අටසිය පනස් අටයි ශතපනහක (රු. 52,858.50) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2004.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004 ක් වූ ජුනි මස 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද්දේකැටියේ කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ කන්දෙගෙදර හා මෙතන්ගරේ පිහිටි කන්දේගෙදර වත්ත යන ඉඩමට බී. එච්. ඒ. ද සිල්වා මානක තැන විසින් 1996.10.15 වැනි දින මැන සෑදූ පිඹුරු අංක 1651 ඒ ප්‍රකාර කැබලි අංක277 දරන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 85/140 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-905

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 01/0/00/04349.

ණයකරුගේ සම්පූර්ණ නම : සුරවීර ආරච්චිලාගේ සේනානායක සුරවීර

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එච්. අමරසිංහ විසින් ලියා සහතික කරන ලද 882 හා 1999.02.16 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ විසිනවදහස් පහයි ශත විස්සක (රු. 1,29,005.20) මුදලක් වර්ෂ 2002.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහතරදහස් හයසිය අසූහයයි ශත දෙකක (රු. 94,686.02) මුදලද, වර්ෂ 2002.11.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හතරදහස් තුන්සිය දහනවයයි ශත දහඅටක් (රු. 34,319.18) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ විසිනවදහස් පහයි ශත විස්සක් (රු. 1,29,005.20) ද,

(2) එකී රුපියල් අනූහතරදහස් හයසිය අසූහයයි ශත දෙකක (රු. 94,686.02) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2002.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ටී. එම්. එස්. පීරිස් යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභාවේ වල්ගම ග්‍රාමයේ හි පිහිටි හික්ගහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට 1995.07.23 දින එල්. ඩී. මොල්ලිගොඩ මානක තැන විසින් මැන සම්පාදිත අංක95/119 පිඹුර ප්‍රකාර ලොට් 39 සී ට මායිම්, උතුරට : පිඹුරු අංක 95 දැක්වෙන කැබලි අංක 39 බී සහ කැබලි අංක 13, නැගෙනහිරට : කැබලි අංක 13 පිඹුරු අංක 95 දැක්වෙන, දකුණට : පිඹුරු අංක 95 දැක්වෙන කැබලි අංක 13, බටහිරට : පිඹුරු අංක 95 හි දැක්වෙන කැබලි අංක 38 යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0, රු. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම සහ ඊට අයත් සියළුදේද, මාර්ග අයිතියද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 411/28 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2003 ක් වූ ජනවාරි මස 24 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

09-912

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/15810/සීඑම්9/251.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ශාන්ති සමරසිංහ විසින් සහතික කරන ලද 1988.08.24 දින හා අංක 1479 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම රත්මලාන පදිංචි හිතනදුර දුමින්ද ලලිත් ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑ නවදහස් නවසිය විසි හතයි ශත විසිඑක (රු. 1,79,927.21) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1479 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැටනමයයි ශත හැත්තෑ දෙක (රු. 69.72) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාවට අයත් රත්මලාන කඳවල කොට්ඨාස අංක29, 3 වන හරස් පාර වරිපනම් අංක 16 (කොටස) දරන කඳවල ස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 109ඒ ලෙස දැක්වෙන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකසන ලද 1986.09.14 දින සහ අංක 1484 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රු. 0, පර්. 20.15 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද පිඹුරු අංක 33 හි දැක්වෙන වෙන් කරන ලද මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-903/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 17/62570/ඩී17/123.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.01.31 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සුමිත්ත ද සිල්වා විසින් සහතික කරන ලද 1998.04.25 දින හා අංක 144 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම අනුරාධපුරය පදිංචි ජයන්ත සමරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුදල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් හය දහස් නවසිය අටයි ශත අසූව (රු. 2,46,908.80) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 144 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ නවයයි ශත අනූ දෙක (රු. 79.92) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවැරිය යුතු වන්නේය.

#### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පලාත, නැගෙනහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සහ අනුරාධපුර නගර සභා සීමාවේ පියවර II හි පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් සාදවා තමා භාරයේ තබා ඇති 13 වැනි ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.4 දරන අවසාන නගර පිඹුරේ කබැලි අංක 1055 ලෙස දක්වා ඇති බිම් කොටසෙන් හෙක්ටයාර් 0.0678 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමගවේ.

එම ඉඩම වර්තමානයේ බලයලත් මිනින්දෝරු කේ. කේ. සිල්වා විසින් සැකසූනු අංක 1609 හා 1997.08.11 දිනැති මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

09-903/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 8/55292/ඉසඩ් 8/033.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.22 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එන්. අරුමාහැන්දි විසින් සහතික කරන ලද 1994.12.03 දින හා අංක 1476 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම රත්ගම පදිංචි මැද දූවෙගේ රොස්මන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ විසි දහස් පන්සිය විසිහතයි ශත හැත්තෑ හතර (රු. 1,20,527.74)ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1476 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසි දෙකයි ශත තිස් හතර (රු.22.34)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවැරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, රත්ගම හැගොඩ පිහිටි මුදියන්සෙගෙවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. රණවීර විසින් සකසන ලද 1993.05.05 දින සහ අංක 3099 දරන මිණුම් පිඹුරේ කැබැලි අංක 8සී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 30ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 8ඩී මතින් ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

09-903/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස් - 1/36420/ටීඑෆ්1/236.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2003.03.27 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාලබේ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඥානසිරි විසින් සහතික කරන ලද 1998.12.23 දින හා අංක 6504 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හෝකන්දර පදිංචි වේරගලගේ දොන් කමලසේන උපතිස්ස සහ යාපා මුදියන්සේලාගේ වලව්වේ චන්ද්‍රාවතී කුමාරිහාමි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.02.09 දිනට මුල් ණයමුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාර ලක්ෂ පනස් නවදහස් නවසිය හැත්තෑ එකයි හත දහහත (රු. 4,59,971.17) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6504 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූ දෙකයි ශත දහය (රු. 92.10) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (අතුරුගිරිය උප කාර්යාලයේ) හෝකන්දර පිහිටි දියපොරගහවත්ත *හෙවත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් සකසන ලද 1998.06.23 දිනැති සහ අංක 4385 දරන පිඹුරේ කැබලි අංක ජී වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 28.82 ක්වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එකී කැබලි අංක ජී. හෝකන්දර පිහිටි දියපොරගහවත්ත *හෙවත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ නැවත මැනුමකි. එය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීම් කාර්යාලයේ ජී 932/192 ලෙස ලියාපදිංචි වී ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

09-903/1

---

එන්(පීවීඑස්) 37319.

### 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ශ්‍රීනාම ඇග්‍රෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.04.21 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ශ්‍රීනාම ඇග්‍රෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට සීමාසහිත ශ්‍රීනාම ඇග්‍රෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 අගෝස්තු මස 25 වන දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-752

---

එන්(පීවීඑස්) 20515.

### 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ සීමාසහිත හයි-ටෙක් ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.01.23 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත හයි-ටෙක් ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සීමාසහිත හයි-ටෙක් ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්. සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 අගෝස්තු මස 25 වන දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-751

එන්(පීවීඑස්)17920.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373 (3) වගන්තිය යටතේ සීමාසහිත ඇතීනා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1996.10.08 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ඇතීනා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සීමාසහිත ඇතීනා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්. සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 අගෝස්තු මස 25 වන දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-753

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0130000196.

ණයකරුගේ සම්පූර්ණ නම : කුමාරසිංහ රාජපක්ෂ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. මාතරආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 1772 හා 2002.10.22 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්නමදහස් හතලිස්හතයි ශත අසූඑකක (රු. 1,49,047.81) මුදලක් වර්ෂ 2004.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්එක්දහස් හත්සිය තිස්හතරයි ශත නමයක (රු. 1,31,734.09) මුදල ද, වර්ෂ 2004.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් දාහත්දහස් තුන්සිය දහතුනයි ශත හැත්තෑදෙකක් (රු. 17,313.72) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්නමදහස් හතලිස්හතයි ශත අසූඑකක් (රු. 1,49,047.81) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්එක්දහස් හත්සිය තිස්හතරයි ශත නමයක (රු. 1,31,734.09) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2004.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004 ක් වූ නොවැම්බර් මස 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙ පත්තුවේ, හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ පනාගොඩ ග්‍රාමයෙහි පිහිටි ඇඹුල්ගම පාරේ වරිපනම් අංක18/14 හි පිහිටි ගලබොඩවත්ත නමැති ඉඩමට 1997.08.13 දින එස්. වික්‍රමසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 8195 පිඹුර ප්‍රකාර ලොට් 02 ට මායිම්, උතුරට : ලොට් 01 ද, නැගෙනහිරට : ලොට් 07 (අඩි 1 පළල පාර) ද, දකුණට : ලොට් 07 සහ ලොට් 03 ද, බටහිරට : පිඹුරු අංක 2887 හි දැක්වෙන එම ඉඩමේම ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අක්. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ. 1403/14 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09 - 908

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500001410.

ණයකරුගේ සම්පූර්ණ නම : බමුණුසිංහගේ ප්‍රභාත් චමිල ගුණරත්න.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. විජේවර්ධන විසින් ලියා සහතික කරන ලද 7383 හා 2002.05.09 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ

විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැටහත්දහස් දහයයි ශත විසිනමයක (රු. 67,010.29) මුදලක් වර්ෂ 2005.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හයදහස් එකසිය අනූවයි ශත විසිදෙකක (රු. 56,190.22) මුදලද, වර්ෂ 2005.10.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහදහස් අටසිය විස්සයි ශත හතක් (රු. 10,820.07) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැටහත්දහස් දහයයි ශත විසිනමයක් (රු. 67,010.29) ද,

(2) එකී රුපියල් පනස්හයදහස් එකසිය අනූවයි ශත විසිදෙකක (රු. 56,190.22) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2005.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ ජනවාරි මස 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

## උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඳුපිට පත්තුවේ, ආරුගම්මන ග්‍රාමයෙහි පිහිටි ඉදිරිච්චිගලමුල හේන නමැති ඉඩමට 1989.08.03 දින ටී. එම්. ටී. බී. තෙන්නකෝන් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1072/ඒ/1989 පිඹුර ප්‍රකාර ලොට් 6 ට මායිම්, උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට : මානෙළඩහේන ද, දකුණට : ලොට් 7 ද, බටහිරට : ප්‍රධාන පාරේ සිට හත්තපිටිය දක්වා වූ ගම්සභා පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතයි දශම දෙකක (අ. 0, රූඩ් 0, පර්. 17.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 875/227, ඊ 1125/180, 181 හි ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කියන ලද ආරුග්ගම්මන ග්‍රාමයෙහි පිහිටි ඉදිරිච්චිගලමුල හේන නමැති ඉඩමට 1989.08.03 දින ටී. එම්. ටී. බී. තෙන්නකෝන් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1072/ඒ/1989 පිඹුර ප්‍රකාර ලොට් 7 ට මායිම්, උතුරට : ලොට් 6 සහ මනෙළඩහේන ද, නැගෙනහිරට : ලොට් 10 ද, දකුණට : ලොට් 8 ද, බටහිරට : ගම්සභා පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 17.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 875/228 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

09-907

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිනුම් අංකය : 1782819501.

2006ක් වූ ජූලි මස 14 වන දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. උඩුවාවල විසින් සහතික කරන ලද 2002 දෙසැම්බර් මස 14 වන දින අංක 1069 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ සියඹලාදුව පතිරනගේ ලයානන්ද රත්නසිරි ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ අනූනවදාස් අටසිය හැටහයක (රු. 11,99,866.00) මුදලක් 2006 ජනවාරි මස 31 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකලොස් ලක්ෂ අනූනවදාස් අටසිය හැටහයක (රු.11,99,866.00) මුදල හා 2006 පෙබරවාරි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,65,000.00 ක මුදලක් සඳහා වාර්ෂිකව 22% බැගින් වූ පොලියද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1069 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තු කුලගම්මන සියපත්තුවේ රනවන ගමේ පිහිටි ගම්පොලයාගේ වත්තහේන දැන් වත්ත නැමැති ඉඩමට බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 1995 පෙබරවාරි මස 01 වන දින අංක 4905 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 (ඉහත කී මානක තැන විසින් ලොට් 01 සහ 02ට සිදුකරන ලද නැවත මැනීමක්) ට මායිම් එනම් - උතුරට : ලොට් 04 සහ එක්ස් ලෙස ලකුණු කර ඇති පාරද, නැගෙනහිරට : ලොට් 3න් ද, දකුණට : කංකානම්ගේ වත්තද සහ බස්නාහිරට : පාරෙන්ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි

පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අක්කර 0, රූඩ් 01, පර්චස් 13.05) හා එහි තුළ පිහිටි නිවස හා ඉහත කී පිඹුරු අංක 4905 හි සඳහන් X ලෙස ලකුණු කර ඇති මාර්ගයද වී. සී. පාර දෙසට දිස්වෙන පිඹුරු අංක 4905 හි ලකුණු කර ඇති මාර්ගයද පාවිච්චි කිරීමේ අයිතියද සමගින් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 714/160 වෙළුම පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-896/4

---

## සීමාසහිත සෙලාන් බැංකුව-වැලිමඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.28 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0570-05757230-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද 1996 පෙබරවාරි මස 19 දිනැති අංක 8836 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වැලිමඩ පදිංචි මොහමඩ් අබුබකර් අබ්දුල් කපූර් ගේ පුත් fපලීල් මාර්සුක් හෙවත් අබ්දුල් කfපූර් fපලීල් මාර්සුක් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ දහහතර දහස් හත්සිය හතළිස් අටයි ශත විසි දෙකක (රු. 4,14,748.22) මුදලක් 2005 පෙබරවාරි 28 වෙනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 4,14,748.22 මුදලද, 2005 මාර්තු 1 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එකී මුදලට වර්ෂයකට සියයට තිහ (30%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 8826 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ කෝට්ඨාශයේ, දඹවින්න පළාත, කෝරළේ වැලිමඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ දිව්තොටවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එච්. බී. ජෝසප් විසින් සාදන ලද 1971 නොවැම්බර් මස 29 දිනැති අංක 140/71/ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මොරයාවත්තහේන නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 885 දරන සැලැස්මේ සඳහන් 1බී කැබැල්ල ද, නැගෙනහිරට : අඩි 20ක් පලල පාර සඳහා වෙන් කිරීම ද, දකුණට : මෙම ඉඩමේ කොටස සහ බස්නාහිරට : රජයේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 140/7/1/ඒ දරන සැලැස්ම අනුව පර්චස් දහඅටක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 18) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී386/148 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී.කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

09-874

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැණීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1670000588.

2006 ජූලි මස 14 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් සහතික කරන ලද 2003 මැයි මස 29 වෙනි දින අංක 6729 දරන සහ 2003 සැප්තැම්බර් මස 3 වෙනි දින අංක 7047 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම 'සුනිලා කන්ස්ට්‍රක්ෂන්ස්' යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගොත්ජටුව වඩුගේ චන්ද්‍රතිලක ණයකරු හැටියට ද. පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හතළිස් පන්ලක්ෂ විසි හතර දහස් හත්සිය දහයයි ශත හතළිස් හතරක (රු.45,24,710.44) මුදලක් 2006 මාර්තු 21 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හතලිස් පන්ලක්ෂ විසිහතර දහස් හත්සිය දහයයි ශත හතළිස් හතරක (රු. 45,24,710.44) ක මුදලට 2006 මාර්තු මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට එකී මුදල මත 25% වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලක් අඩු කොට එකී අංක 6725 හා 7047 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

බලයලත් මානක සුගත් සමරවික්‍රම විසින් 1986 ජුනි මස 30 වන දින සාදන ලද අංක 44/1986 දරන පිඹුර පරිදි (බලයලත් මානක ඩී. ඩබ්ලිව්. එදිරිසිංහ විසින් සාදන ලද 1945 පෙබරවාරි 07 වන දින දරන පිඹුරු අංක

1952 හි ලොට් ඒ හි නැවත මැනීමකි) බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අධිකාරිපත්තු සියනෑ කෝරළේ ගම්පහ ලියාපදිංචි කොට්ඨාසය තුළ වැබොඩ පිහිටි යකම්බෙවත්ත ඉඩම් කොටසට මායිම් : උතුරට : ජී. ඒ. සුභතේරිස්ට හා ජී. ඒ. තෝමස් සිංඤ්ඤොට අයිති ඉඩම් හා කුඹුරු නැගෙනහිරට : මාර්ගය සහ කේ. ඒ. රුචිතන් සිංඤෝ, අයි. ඩබ්ලිව්. සිරිසේන සහ අනෙක් අයට අයිති ඉඩම් දකුණට : අඩි 6 ක් පළල දෙවට සහ අඩි 18 පළල පාර සහ බටහිරට : කුඹුරු සහ මායිම් තුළ අක්කර එකයි රූඩ් එකයි පර්චස් එකොළහයි (අ. 1, රූ. 1, පර්. 11) විශාලත්වයෙන් යුත් ඉඩම සහ එහි තුළ ඇති ගස්, වැවිලි, හා වෙනත් සියළුදේත් සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 470/68 පත්‍රිරුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

09-854

---

## රුහුණ සංවර්ධන බැංකුව - කරන්දෙනිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශේෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2004.11.04 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සුහසිංහ මහතා විසින් සහතික කරන ලද 2002.09.05 දින හා අංක 9040 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අම්බලන්ගොඩ, කුලීගොඩ, වේනමුල්ලෙහි පදිංචි මීගෙල්වසම් රූපවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් පනස්පන්දහස් පන්සියයක (රු.55,500) ක මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2003.12.31 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් පනස්පන්දහස් පන්සියයක (රු.55,500) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදල ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 9040 උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, වේනමුල්ලේ පිහිටි සුදිරිංගුවත්ත *නොහොත්* සුදිරිංගුගේ වගාකළ තයිදෙකංකානම්ගේ ගෙදරවත්තේ නැගෙනහිර කැබැල්ලෙන් බලයලත් මිනින්දෝරු ඩී. පී. මෙන්ඩිස්ගේ 1990.10.07 දින අංක 1102 පිඹුරේ නිරූපිත ලොට් 5 දරන කැබැල්ල නම් වූ උතුරට : පාරට වෙන්කළ මේ ඉඩමේ ලොට් 06 ද, නැගෙනහිරට : හිමේ වෙදරාලගේවත්ත සහ තවත් අය පදිංචි වත්ත *නොහොත්* හිමේ වෙදගෙ වත්තද, දකුණට : තිඹිරිගහවත්ත සහ මීගෙල්වසම් කරෝලිස්ට සහ තවත් අයට අයත් ඉඩමද, බස්නාහිරට : මේ ඉඩමේ අංක 04 කැබැල්ලද, මායිම් වූ පර්චස් දහඅටයි දශම නවයයි හයක්( පර්. 18.96) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේද වේ.

මෙම දේපල ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2002.01.31 දින අංක C749/119 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර.

09-801/1

---

## රුහුණ සංවර්ධන බැංකුව - පිටබැද්දර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශේෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2006.03.29 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහාන් එල්. ජී. ගමාච්චිගේ මහතා විසින් සහතික කරන ලද 2003.08.21 දිනැති අංක 4444 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කරගොඩ උයන්ගොඩ, ඉහළ විට්යල, පහලහේන වත්ත හි පදිංචි යකල්ල කංකානම්ගේ දොන් පියසිරි *නොහොත්* යකල්ල කංකානම්ගේ පියසිරි ජයන්ත සහ යකල්ල කංකානම්ගේ මෙත්මිණි ජයන්ත ජයතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හයලක්ෂ පනස්හයදහස් පන්සියයක (රු. 6,56,500) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2005.04.30 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් හයලක්ෂ පනස්හයදහස් පන්සියයක (රු. 6,56,500) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4444 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියඹලාගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාගොඩ ගමේ පිහිටි අගපි 12 හි අංක 277 සහ 280 දරන කැබැලිවලින් සමන්විත මහඅලදෙනියහේන, නාවලහේන. කලුගලහේන, නම් වූ උතුරට : පාරට වෙන්කළ බිමද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 282 දරන කැබැල්ලද, දකුණට : හත්තොටුව ගම්මායිමද, බස්නාහිරට : මෙම ඉඩමේම අංක 276 සහ 275 දරන කැබැලි ද, මායිම් වූ අක්කර විසිදෙකයි, රූඩ් දෙකයි, පර්චස් තිස්හතක් (අක්. 22, රූ. 02, පර්.37) විශාල ඉඩමේ මුළු බිම් ඒතුළ පිහිටි සියළු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමග වේ. (ආර්. 5384 සහ 1958.01.14)

ඉහත කී ඉඩම සී. එස්. ජයවර්ධන බලයලත් මිණින්දෝරු තැන සකස් කළ අංක 9173 සහ 2003.10.30 දින දරන පිඹුරේ පහත පරිදි නිරූපනය වේ.

ඉහත කී සියඹලාගොඩ ගමේම පිහිටි අගපි 12 හි අංක 277 සහ 280 දරන කැබැලි වලින් සමන්විත මහඅලදෙනියහේන, නාවලහේන, කලුගලහේන නම් වූ උතුරට : අගපි 12 හි අංක 281 දරන කැබැල්ල වෙන්වීමට ඇති පාරට වෙන්කළ බිමද, නැගෙනහිරට : අගපි 12 හි අංක 282 කැබැල්ලද, දකුණට : අගපි 13 දරන හත්තොටුව ගම් මායිමද, බස්නාහිරට : අගපි 12 හි අංක 276 සහ 275 දරන කැබැලිද මායිම් වූ ඉඩමේ මැදින් වැටී ඇති පාර සහ පාර රක්ෂිත බිම හැර අක්කර විසිදෙකයි, රූඩ් දෙකයි, පර්චස් තිස් හතක් (අක්. 22, රූ.02, පර්.37) ක් විශාල ඉඩමේ මුළු බිම, ඒතුළ පිහිටි සියළු ගහකොළ පලතුරු, ගොඩනැගිලි ආදිය සමග වේ.

මෙම දේපල 147/147/200/Aවං 13/204 යටතේ 2004.06.11 දින මොරවක ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරි,
ටී. ජී. විමලරත්න.

2006 මාර්තු මස 17 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

09-801/2

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 01/1/44/00269.

ණයකරුගේ සම්පූර්ණ නම : කොඩිතුවක්කු ආරච්චිගේ දොන් සුමිත්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එන්. පී. අමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 8594 හා 1996.07.08 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්තුන්දහස් හාරසිය දහතුනයි ශත පනස්හයක (රු. 1,43,413.56) ක මුදලක් වර්ෂ 2003.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිහතරදහස් නවසිය හැටඑකයි ශත පහළොවක (රු. 1,24,961.15) ද, වර්ෂ 2003.05.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහඅටදහස් හාරසිය පනස්දෙකයි ශත හතලිස්එකක් (රු. 18,452.41) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්තුන්දහස් හාරසිය දහතුනයි ශත පනස්හයක (රු. 1,43,413.56) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිහතරදහස් නවසිය හැටඑකයි ශත පහළොවක (රු. 1,24,961.15) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොළියක් 2003.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ වැවල පිහිටි කැකුණගහවත්ත *හෙවත්* ගන්ගුලේකනත්ත, ගන්ගුලේකනත්ත, අටබෝගහවත්ත, ගල්කැටියේවත්ත *හෙවත්* කහපොලගේවත්ත සහ දෙල්ගහවත්ත යන බෘෘක් සයිඩ් වතුයායේ කොටසක් වන (නමුත් ලියාපදිංචි වී ඇත්තේ කැකුණගහවත්ත *හෙවත්* ගන්ගුලේකැත්ත ලෙසය) ඉඩමට වර්ෂ 1995.11.25 දින ජේ. පී. කම්මානන්කඩ මානකගේ අංක 1863 පිඹුර ප්‍රකාර ලොට් 2ට මායිම්, උතුරට අංක 2494 පිඹුරේ ලොට් 1 දැනට කේ. ඩබ්. සුනීතාට හිමි ඉඩම ද, නැගෙනහිරට : අංක 2494 හි ලොට් 13 දැනට බී. වී. එස්. ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : අංක 2494 පිඹුරේ ලොට් 3 සහ ටී. ප්‍රනාන්දුගේ ඉඩම සහ, බස්නාහිරට : 1 වන පටුමහද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම. මෙය ඒ තුළ පිහිටි සැම සමහ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2144/196හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2003 ක් වූ ජූලි මස 31 දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

09-909

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500000810.

ණයකරුගේ සම්පූර්ණ නම : වෙලන්තලාවේ සුමතිපාල.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. විජේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 5368 හා 1998.10.20 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හයසිය පනස්හයයි ශත විසිහයක (රු. 1,14,656.26) ක මුදලක් වර්ෂ 2004.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූදෙදහස් දෙසිය හැත්තෑහතයි ශත අනූදෙකක (රු. 92,277.92) ද වර්ෂ 2004.10.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිදෙදහස් තුන්සිය හැත්තෑඅටයි ශත තිස්හතරක් (රු. 22,378.34) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හයසිය පනස්හයයි ශත විසිහයක (රු. 1,14,656.26) ද,

(2) එකී රුපියල් අනූදෙදහස් දෙසිය හැත්තෑහතයි ශත අනූදෙකක (රු. 92,277.92) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2004.1 1.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ නොවැම්බර් මස 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

## උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, තුන්පලාත පත්තුවේ, ගල්බොඩ කෝරළේ, පෝඩාපේ ග්‍රාමයන්හි පිහිටි වෙලන්තලාවේ වත්ත නැමැති ඉඩමට 1986.07.03 දින සී. කේ. බැද්දේවෙල මානක විසින් මැන සම්පාදිත අංක 5159/4296 පිඹුර ප්‍රකාර ලොට් 06ට මායිම්, උතුරට : අම්බලකන්ද සිට අරණායකට ඇති ප්‍රධාන පාර ද, නැගෙනහිරට : කහටගහ මුල වත්ත හා ඇල ද, දකුණට : ඇල ද, බස්නාහිරට : ගම් සභා පාර හා ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් හතයි දශම විසිහතරක (අ. 0, රූ. 2, පර්. 7.24) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමඟ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 548/79හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-906

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.